# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1933/32 - 2015 සැප්තැම්බර් මස 23 වැනි බදාදා - 2015.09.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : PUT/LND/01/01/06.

පුත්තලම ජල සම්පාදන ක්‍රමයේ පොම්ප ක්‍රියාකරුවන්ගේ නිළ නිවාස සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් කොටස ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් කැබලිවල විස්තර:

පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 617 බී පුත්තලම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ මනල්ගුණ්ඩුව ගමෙහි පිහිටි පුත්තලම දිස්ත්‍රික් මිනුම් අධිකාරි විසින් 2012.11.01 දිනැතිව සකස් කර ඇති පු. 5040 මූලික පිඹුරේ කැබලි අංක 02 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0074ක් පමණ වන වතු මායිම් තුළ පිහිටි ඉඩම් කැබැල්ල.

*උතුරට*: පු. 5040 මූලික පිඹුරේ කැබලි අංක 01 සහ මනල්ගුණ්ඩුතෝට්ටම් නැමති ඉඩම; *නැගෙනහිරට*: නෙඩුම්කුලම්තෝට්ටම් නමැති ජුම්මාපල්ලිය හිමිකම් කියන ඉඩම; *දකුණට*: නෙඩුම්කුලම්තෝට්ටම් නමැති ජුම්මාපල්ලිය හිමිකම් කියන ඉඩම සහ නගර සභා පාර; *බටහිරට*: නගර සභා පාර.

ඉහත සඳහන් ඉඩම් කැබලිවලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ වර්ෂ 2015 නොවැම්බර් මස එකොළොස් (11) වැනි දින පෙ.ව. 10.00 ට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2015 නොවැම්බර් මස 04 වැනි දිනට හෝ ඊට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

එම්. ආර්. එම්. මලික්,
ප්‍රාදේශීය ලේකම්,
පුත්තලම.

2015 සැප්තැම්බර් මස 17 වැනි දින,
පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 412

---

### ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

අංක 1769/21 හා 2012.08.03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 21 A පිටුවේ කැබලි අංක 4007හි ප්‍රමාණය හෙක්. 0.0478 යනුවෙන් සාවද්‍ය ලෙස සඳහන් වී ඇත.

එම ප්‍රමාණය හෙක්. 1.0478 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

නිරෝෂණ කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල-පල්ලේගම.

2015 සැප්තැම්බර් මස 19 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ලග්ගල-පල්ලේගම.

10 - 430


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 22378 - 18 - (2015/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.